(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(6).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 මාර්තු 24 සිකුරාදා**

---

**2023 අප්‍රේල් 04 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 පෙබරවාරි 22 දිනැති අංක 2320/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.22 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 පෙබරවාරි 22 දිනැති අංක 2320/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.22 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජනවාරි 30 දිනැති අංක 2317/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

**2023 අප්‍රේල් 25 අඟහරුවාදා**

1320/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇලහැර-ගිරිතලය අභයභූමියේ විශාලත්වය අක්කරවලින් කොපමණද;

(ii) මේ වනවිට එම අභයභූමියට අයත් අක්කර 250ක් පමණ විශාලත්වයකින් යුත් ප්‍රදේශයක විශාල පරිසර හානියක් සිදු වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1326/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ බඩඉරිඟු වගා කරන ලද බිම් ප්‍රමාණය;

(ii) වර්ෂ 2020/2021 මහ කන්නයේදී බඩඉරිඟු වගා කරන ලද බිම් ප්‍රමාණය;

(iii) එම කන්නයේ වගා කිරීම සඳහා භාවිතා කරන ලද දේශීය බඩඉරිඟු බීජ ප්‍රමාණය සහ ආනයනික බීජ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන්;

(iv) දේශීය බඩඉරිඟු බීජ කිලෝග්‍රෑම් එකක සහ ආනයනික බීජ කිලෝග්‍රෑම් එකක මිල වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අක්කර එකක බඩඉරිඟු වගාකිරීම සඳහා අවශ්‍ය බීජ ප්‍රමාණය;

(ii) එම බීජ සඳහා වැය වන මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1457/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් සඳහා ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පත නිකුත් කර, අවසන් කිරීමට අපේක්ෂිත කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1503/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු මේ වනවිට සිදු කරන්නේද;

(ii) එම සංවර්ධන කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(iii) දේශීය හා විදේශීය සංචාරකයන්ට එම සත්වෝද්‍යානය නැරඹීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සකස් කර තිබේද;

(iv) එම සත්වෝද්‍යානයට ඉදිරියේදී සංචාරක ආකර්ෂණය වැඩිකර ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1539/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෘහසේවිකාවන් ලෙස වාර්ෂිකව විදේශ ගතවන ශ්‍රී ලාංකික කාන්තාවන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ විදේශ ගතවීමේදී සේවා ගිවිසුම් අත්සන් කරන්නේද;

(iii) එසේ නම්, එම සේවා ගිවිසුමේ වලංගු කාලය කොපමණද;

(iv) ඉහත සඳහන් ගෘහසේවිකාවන් හා ඔවුන්ගේ පවුල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පසු විපරම් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1575/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට, පූනරින්, සියඹලාණ්ඩුව සහ ත්‍රිකුණාමලය සූර්යබල උද්‍යාන මේ වනවිට ස්ථාපනය කර තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් සූර්යබල උද්‍යානයෙන් ජාතික විදුලිබල පද්ධතියට ලබා දෙනු ලබන විදුලිය ඒකක ප්‍රමාණය මෙගාවොට්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් සූර්යබල උද්‍යාන මේ වනවිට ක්‍රියාත්මක කර නොමැති නම්, එම එක් එක් සූර්යබල උද්‍යානය ඉදිකිරීමේ ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් සූර්යබල උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1616/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1996 දී අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති මුතුරාජවෙල අභයභූමියේ මායිම් මේ දක්වා සලකුණු කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(ii) ඉහත අභයභූමිය තුළ පවතින රජයේ හා පුද්ගලික ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට මේ දක්වා ක්‍රියා කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ සිතියම් අනුව හඳුනාගෙන ඇති සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගෙන ඇති ඉහත අභයභූමියට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජයේ සිතියම් අනුව හඳුනාගෙන ඇති ඉඩම් ප්‍රමාණය සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගෙන ඇති ඉඩම් ප්‍රමාණය අතර පරස්පරතාවයක් ඇති වීමට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1630/2023

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිරියේදී ගුරු වෘත්තිය සඳහා උපාධිධාරීන් පමණක් බඳවාගැනීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම උපාධිධාරීන්ට ගුරු පුහුණුවක් ලබා දෙන්නේද;

(iii) එම උපාධිධාරීන් බඳවාගැනීමේදී ඔවුන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම, ක්‍රීඩා කුසලතා හා සෞන්දර්යාත්මක හැකියාවන් සම්බන්ධයෙන් සලකා බලන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෘත්තීය මූලික අධ්‍යාපන ක්‍රමයක් සඳහා විෂය නිර්දේශ සංශෝධනය කිරීමට පියවර ගන්නේද;

(ii) පාසල් සිසුන්ට වෘත්තීය පුහුණු අධ්‍යාපනය ලබා දීම සඳහා වෘත්තීය පුහුණු ගුරුවරුන් බඳවාගැනීමට කටයුතු කරන්නේද;

(iii) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මහජන අදහස් විමසීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/2023

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාය යෑම් හේතුවෙන් උඩරට දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනයට නිරන්තරයෙන් බාධා සිදු වන බවත්;

(ii) එමඟින් ඇති වන ප්‍රමාද වීම් හේතුවෙන් විදේශීය සංචාරකයන් හා දේශීය මගීන් යන දෙපාර්ශ්වයම අපහසුතාවයට පත්වන බවත්;

(iii) එම දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යුද හමුදා භටයන් සහ දුම්රිය සේවකයන් යොදා ගැනීම කාර්යක්ෂම නොවන බවත්;

(iv) ලෝකයේ වෙනත් රටවල නවීන තාක්ෂණය භාවිතා කරමින් මෙවැනි කාර්යයන් සිදු කරනු ලබන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවන්ගේ සහ තාක්ෂණ නිලධාරින්ගේ දැනුම උපයෝගී කර ගනිමින් දුම්රිය මාර්ගවල පස් ඉවත් කිරීම සඳහා බැකෝ යන්ත්‍රයක් නිර්මාණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1635/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 සිට 2022.06.30 දින දක්වා කාලය තුළ විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා විදේශ රැකියා සඳහා යොමු කර ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ශ්‍රමිකයන් යොමුකර ඇති රටවල් කවරේද;

(iii) එම එක් එක් රට සඳහා යොමුකර ඇති ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ වනවිට ශ්‍රී ලංකාවට ලැබී ඇති විදේශ රැකියා කෝටාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) රැකියා සඳහා විදේශගත වීමට අපේක්ෂාවෙන් සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා ක්‍රියාත්මකව පවතින භාෂා පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

**2023 අප්‍රේල් 26 බදාදා**

1674/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ, මුරුංගන් රෝහල 2018 වර්ෂයේදී මූලික රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලද නමුත්, මේ දක්වා ඊට සරිලන පරිදි එම රෝහලට අවශ්‍ය පහසුකම් සපයා නොමැති බව දන්නේද;

(ii) වෛද්‍යවරුන් ඇතුළුව එම රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහලේ මෘත ශරීරාගාරයක් නොමැති වීම හේතුවෙන් මෘත ශරීර මන්නාරම මහ රෝහල වෙතට රැගෙන යාමට සිදු වීමෙන් මහජනතාව දැඩි දුෂ්කරතාවලට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, මුරුංගන් රෝහල සඳහා මෘත ශරීරාගාරයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iii) මුරුංගන් රෝහලේ සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1755/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන්නේද;

(ii) නොඑසේ නම්, එම යන්ත්‍ර ආනයනය කරන්නේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1799/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ බහුල වශයෙන් කිරිගව පාලනය සිදු කරනු ලබන බවත්;

(ii) කිරිගවයින් සඳහා ආහාර සපයා ගැනීමේදී කිරිගොවීන් දැඩි දුෂ්කරතාවයන්ට පත් වන අතර වන සංරක්ෂණ නිලධාරීන් සහ වනජීවී නිලධාරීන් සමඟ නිරන්තරයෙන් ගැටුම් ඇති කර ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, කිරිගවයන්ගේ ආහාර සඳහා සුදුසු තණබිම් හඳුන්වා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1808/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, කොටදෙණියාව ගම කේන්ද්‍ර කර ගනිමින් පසුගිය වර්ෂ කිහිපයක සිට විවිධ අපරාධ ක්‍රියා සිදුවන බවත්;

(ii) මේ වනවිට එම ගම්මානයේ විවිධ අපරාධ ක්‍රියා සිදුවීම හේතුවෙන් එහි වෙසෙන ජනතාව බියට පත් වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2528/2023

ගරු ඉම්රාන් මහරුෆ් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දුම්රිය ස්ථානයේ මගී අවශ්‍යතා ආවරණය කරනු ලබන දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය මැදිරි කොපමණ කාලයක සිට ධාවනය කරනු ලබන්නේද;

(iii) ඉහත සඳහන් දුම්රිය මැදිරි ඉතා පැරණි වන අතර හා මේ වනවිට භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පවතින බව දන්නේද;

(iv) ශ්‍රී ලංකාවේ බොහෝ දුම්රිය ස්ථාන සඳහා නවීන දුම්රිය මැදිරි හා දුම්රිය එන්ජින් ලබා දී ඇති නමුත් ත්‍රිකුණාමලය දුම්රිය ස්ථානය සඳහා නවීන දුම්රිය මැදිරි හා දුම්රිය එන්ජින් ලබා නොදීමට හේතුව කවරේද;

(v) ත්‍රිකුණාමලය දුම්රිය ස්ථානය සහ එම දුම්රිය ස්ථානයට ලබා දී ඇති දුම්රිය මැදිරි නවීකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2573/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් වර්ෂයේදී වී කිලෝග්‍රෑම් එකක් මිලදී ගන්නා ලද මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට වී අලෙවි මණ්ඩලයේ පවතින වී තොග ප්‍රමාණය කොපමණද;

(ii) වී අලෙවි මණ්ඩලය විසින් සතොස හා සමූපකාර සමිති සඳහා පමණක් වී තොග ලබා දෙන්නේද;

(iii) නොඑසේ නම්, පෞද්ගලික අංශයටත් වී තොග ලබා දෙන්නේද;

(iv) සත්ත්ව ආහාර සඳහා වී අලෙවි මණ්ඩලය විසින් වී තොග ලබා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2620/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා බෞද්ධ පුනරුද අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපොළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2689/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022/2023 වර්ෂයේ මහ කන්නයේ වී අස්වැන්න නෙලමින් පවතින බැවින් වී මිලදී ගැනීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවළ කවරේද;

(ii) අක්කරයක භූමියක වී වගා කිරීම සඳහා වියදම් වන මුදල කොපමණද;

(iii) වී මිල තීරණය කිරීමේදී එම මුදල පදනම් කර ගෙන තිබේද;

(iv) පුද්ගලික වෙළෙන්දන් විසින් ඉතා අඩු මිලට වී මිලදී ගැනීම, වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වී භාවිතා කරමින් සහල් හෝ වෙනත් නිෂ්පාදන බිහි කර ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීමට, අපනයන වෙළඳපොළ දියුණු කිරීමට සහ ගොවීන්ට සහන ලබා දීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2841/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ රෝහල්වල මේ වනවිට සේවය කරනු ලබන හෙද නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ හෙද සේවයේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2878/2023

ගරු යදාමිණී ගුණවර්ධන මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රැකියාවල නියුක්ත වී සිටින ශ්‍රී ලාංකිකයන් විසින් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරනු ලබන මුදල් ප්‍රමාණය පසුගිය දශක තුනකට පෙර තිබූ ප්‍රමාණයට වඩා මේ වනවිට ඉහළ අගයක් ගන්නා බව දන්නේද;

(ii) වැඩිම ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාවක් රැකියාවල නියුක්ත වී සිටින විදේශීය රටවල් දහය සහ නගර දහය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වැඩිම ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාවක් මුදල් ප්‍රේෂණය කරනු ලබන විදේශීය රටවල් දහය සහ නගර දහය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ශ්‍රී ලංකාවට වැඩිම මුදල් ප්‍රමාණයක් ප්‍රේෂණය කරනු ලබන විදේශීය රටවල් දහය සහ නගර දහය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) විදේශීය රටවල සිට මුදල් ප්‍රේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද බැංකු හෝ මූල්‍ය ආයතන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

**2023 අප්‍රේල් 27 බ්‍රහස්පතින්දා**

2/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 - 2019 "යහපාලන රජය" සමයේ ශ්‍රී ලංකා මහ බැංකු වංචාව සිදු වූ බව දන්නේද;

(ii) එම වංචාව හේතුවෙන් සිදු වී ඇති මූල්‍යමය අලාභය කොපමණද;

(iii) එම මුදල නැවත අයකර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වංචාවට සම්බන්ධ බවට චෝදනා එල්ලවී ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

383/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ දුරකථන සමාගම්වලට අයත් සිම්කාඩ්පත් රජයේ නිසි නියාමනයකින් තොරව ප්‍රධාන නගරවල පදික වේදිකාවේ අලෙවි කරනු ලබන බවත්;

(ii) එම සිම්කාඩ්පත් වංචනික ලෙස විශාල වශයෙන් මිලට ගනු ලබන පුද්ගලයන් විසින් ඒවා අවභාවිතා කර විවිධ අක්‍රමිකතා සිදු කරනු ලබන බවත්;

(iii) අන්තර්ජාලය හරහා භාණ්ඩ ලබා දෙන බවට පොරොන්දු වී වංචනික ආකාරයෙන් බැංකු ගිණුම්වලට මුදල් බැර කර ගැනීමේ ජාවාරමක් සිදු කරනු ලබන බවත්;

(iv) මහනුවර, රත්නපුර, පිළියන්දල, බදුල්ල සහ කොළඹ ඇතුළු බොහෝ ප්‍රදේශවල තරුණයන් මේ වනවිට එම ජාවාරමෙහි ගොදුරක් බවට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත වංචා වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

419/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි රූපවාහිනී නාලිකා සංඛ්‍යාව සහ ගුවන්විදුලි නාලිකා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රූපවාහිනී නාලිකා බලපත්‍ර කොන්දේසි සහ ගුවන්විදුලි නාලිකා බලපත්‍ර කොන්දේසි අතර විෂමතා පවතින බව පිළිගන්නේද;

(vi) එම විෂමතා ඉවත්කර ඒකමතිකභාවයක් ඇති කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

432/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අලෙවි කරනු ලබන කිරිපිටිවල ඩීසීඩී මෙලමයින්, කෘතිම ලැක්ටෝස්, ඌරු තෙල්, ගව තෙල් හා මානව ශරීරයට අහිතකර වෙනත් රසායන ද්‍රව්‍ය අඩංගු බවට තහවුරු කර ගැනීම සඳහා රජය විසින් පරීක්ෂණ සිදු කර තිබේද;

(ii) එසේ නම්, පරීක්ෂණ සිදු කරනු ලබන ආයතනය/ආයතන කවරේද;

(iii) එම ආයතනය/ආයතන විසින් මේ දක්වා සිදු කරන ලද පරීක්ෂණවලට අදාළ වාර්තා ඉදිරිපත් කරන්නේද;

(iv) ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය පහසුකම් එම ආයතනය/ආයතන සතුව තිබේද;

(v) නොඑසේ නම්, එම පහසුකම් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(i) සඳහන් රසායන ද්‍රව්‍ය අඩංගු බවට තහවුරු වී ඇති කිරිපිටි නිෂ්පාදනය කරනු ලබන ආයතනවලට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

688/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළුකාමම් ප්‍රාදේශීය රෝහල මේ දක්වා උත්ශ්‍රේණිගත කර ඇත්තේ DH - C ශ්‍රේණිය දක්වා පමණක් බව දන්නේද;

(ii) එසේ නම්, එම රෝහල DH -B හෝ A ශ්‍රේණියට උත්ශ්‍රේණිගත කිරීම සඳහා පියවර ගන්නේද;

(iii) එම රෝහල DH -B හෝ A ශ්‍රේණියට උත්ශ්‍රේණිගත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහලේ ප්‍රසව ඒකකය සඳහා අවශ්‍ය උපකරණ (CTG Machine, Warmer) නොමැතිවීම හේතුවෙන් ගර්භනී කාන්තාවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බවත්;

(ii) හදිසි ප්‍රතිකාර අංශය සඳහා අවශ්‍ය උපකරණ කිසිවක් රෝහලේ නොමැති බවත්,

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, ඉහත රෝහල සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම උපකරණ ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

815/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මධ්‍යම රජයට හා පළාත් සභාවලට අයත් රෝහල් සංඛ්‍යාව එම රෝහල් වර්ගීකරණය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල්වල දැඩි සත්කාර ඒකකවල ඇති ඇඳන් සංඛ්‍යාව හා සාමාන්‍ය වාට්ටුවල ඇති ඇඳන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි රෝහල්වල සේවය කරන මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව සහ එම සංඛ්‍යාව, විශේෂඥ වෛද්‍යවරුන් සහ සාමාන්‍ය වෛද්‍යවරුන් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ රෝහල්වල භාවිතා කරනු ලබන ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධ වර්ග අතරින් මේ වනවිට හිඟ ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට අවශ්‍ය ඖෂධ ආනයනය කිරීම සඳහා රජය විසින් වර්ෂයකට වැය කරනු ලබන මුදල රුපියල්වලින් හා ඇ.එ. ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

831/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 746-ඉදිරිලිගොඩ ග්‍රාම නිලධාරි වසමේ, පාසල් මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ මූලික කාර්යය බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ, කළුතර කාර්යාලය විසින් සිදු කරන ලද බවත්;

(ii) ඒ අනුව පළමු අදියර ලෙස ඉහත මාර්ගයේ කොන්ක්‍රීට් ගල් අතුරන ලද බවත්;

(iii) මේ වනවිට එම කොන්ක්‍රීට් ගල්, වර්ෂා ජලයට ගසාගෙන යාම හේතුවෙන් එම මාර්ගය අබලන් වී ගමනාගමනය සඳහා නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉහත අ(iii) හි සඳහන් කරුණ හේතුවෙන් මුදල් අපතේ යාමක් සිදු වී තිබේ නම්, ඊට වගකිව යුතු පුද්ගලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

835/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2016 සිට මේ දක්වා හඳුනාගෙන ඇති, කොළඹ දිස්ත්‍රික්කයේ අධි අවදානම් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාසවල පදිංචි වී සිටින පවුල් අතරින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉහත සඳහන් අධි අවදානම් නිවාසවල පදිංචි වී සිටින පවුල් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීමේ ප්‍රමාදයක් පවතින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

847/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2021 වර්ෂයේදී පනවන ලද රසායනික පොහොර තහනම හේතුවෙන් ශ්‍රී ලංකාවට සිදු වූ ආර්ථික බලපෑම ගණනය කර තිබේද;

(ii) එසේ නම්, වී, තේ, රබර්, කුරුඳු , පොල් සහ එළවළු ආදී එක් එක් භෝගයේ නිෂ්පාදනයේ සිදු වූ පහත වැටීම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රසායනික පොහොර තහනම් කිරීම හේතුවෙන් ගොවීන් ගොවිතැන් කිරීමෙන් ඉවත් වී තිබේද;

(iv) එසේ නම්, එම ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2931/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බිත්තර ඉල්ලුම හා සැපයුම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැති වීමෙන් බිත්තර මිල ඉහළ ගොස් ඇති බව දන්නේද;

(iii) බිත්තර මිල සාධාරණ මට්ටමකට පවත්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

**2023 අප්‍රේල් 28 සිකුරාදා**

858/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2019–2022 කාලය තුළ රජය විසින් නියම කරන ලද කොවිඩ්-19 සඳහා වූ ඔඩ්ඩමාවඩි සුසාන භූමිය තුළ මිහිදන් කරන ලද කොවිඩ්-19 ආසාදිත මෘතදේහ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංඛ්‍යාව ඔවුන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය, ආගම සහ ජීවත් වූ පළාත/ දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) කොවිඩ්-19 ආසාදිත මරණ සඳහා සුසාන භූමියක් වශයෙන් රජය විසින් ඔඩ්ඩමාවඩි තෝරාගත් පදනම කවරේද;

(iv) කොවිඩ්-19 ආසාදිත මරණ සඳහා සුසාන භූමියක් වශයෙන් ඔඩ්ඩමාවඩි යොදාගත් පදනම සහ නිර්ණායක යොදාගනිමින් ඔඩ්ඩමාවඩි හැර වෙනත් ස්ථානයක්/ස්ථාන තෝරාගැනීමට රජය විසින් යම් කිසි උත්සාහයක් දරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නොඑසේනම්, ඒ මන්ද?

866/2023

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිහින්තලේ ප්‍රාදේශීය සභාව විසින් නව වෙළඳ සංකීර්ණයක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වෙළඳ සංකීර්ණයේ ඉදිකර ඇති මුළු කඩ කාමර සංඛ්‍යාව කොපමණද;

(ii) එම කඩකාමර බෙදා දීමේදී අක්‍රමිකාවයක් සිදු වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1301/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ඇඟළුම් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඇඟළුම් කර්මාන්තශාලා තුළින් උත්පාදනය කර ඇති ඍජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2020 සිට මේ දක්වා එම ඇඟළුම් කර්මාන්තශාලා මඟින් ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමට ලැබුණු දායකත්වය ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ඇඟළුම් කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල වී ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය දියුණු කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1302/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) භාණ්ඩ ප්‍රවාහනය සඳහා මේ වනවිට යොදා තිබෙන දුම්රිය සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දුම්රියේ ගමනාන්තය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) භාණ්ඩ ප්‍රවාහනය කිරීමට වැඩි වශයෙන් දුම්රිය යොදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1313/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රංශ රජයේ ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන නැගෙනහිර පළාතේ, මුන්දෙනායි ආරු ගංගා ද්‍රෝණි ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු යටතේ ජලාශ 02ක් ඉදිකිරීමට නියමිත බවත්;

(ii) එම ජලාශවල මැටි වේලි ඉදිකිරීම සඳහා විදේශීය උපදේශකයන්ගේ සහාය ලබා ගැනීමට ඉහත ව්‍යාපෘතියට ණය ආධාර ලබා දෙනු ලබන පාර්ශ්වයන් අපේක්ෂා කරන බවත්;

(iii) එහෙත්, විශේෂඥ දැනුමක් සහිත ඉංජිනේරුවන් මෙරට සිටින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) විදේශීය උපදේශකයන්ගේ සේවය ලබා ගත යුතු බවට ණය ලබා දෙනු ලබන පාර්ශ්වයන් විසින් බලපෑම් කළේ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නැගෙනහිර පළාතේ, ගල්ඔය නවෝදය ව්‍යාපෘතියේ සියලුම අරමුදල් වැය කර ඇතත් මේ වනවිටත් යාන්ත්‍රික වැඩ කොටස් ඇතුළු සමහර වැඩ නිම කර නොමැති වීමෙන්, එම ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් අවසන් කර නොමැති බව දන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1318/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැලණි ගඟ ආශ්‍රිතව ස්ථාපිත කර ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලාවලින් ඉවතලන අපවිත්‍ර ජලය එම ගඟට එක්කරනු ලබන බව දන්නේද;

(iii) එම අපවිත්‍ර ජලය හේතුවෙන් කැලණි ගං ජලයට සිදු වන හානිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) අපවිත්‍ර ජලය කැලණි ගඟට මුදා හැරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1321/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මින්නේරිය ජාතික උද්‍යානය හා කවුඩුල්ල ජාතික උද්‍යානය යන උද්‍යානවල සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් "හුරුළු පරිසර වනෝද්‍යාන සංවර්ධන සමිතිය" නමින් සංවිධානයක් පිහිටුවා ඇති බවත්;

(ii) වන සංරක්ෂණ අධ්‍යාපනතේ විධිවිධානවලට පටහැනිව එම සංවිධානය ස්ථාපිත කර ඇති බවත්;

(iii) එම සංවිධානය විසින් රුපියල් එක් කෝටි හැත්තෑ ලක්ෂයක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට පටහැනි වන ආකාරයට ලබා ගෙන ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එම සංවිධානය විසින් සිදු කර ඇති මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1327/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එප්පාවල, සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් විධායක ශ්‍රේණියේ නිලධාරින් සංඛ්‍යාව;

(iii) එම නිලධාරින්ගේ මාසික ප්‍රවාහන දීමනාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එප්පාවල, සීමාසහිත ලංකා පොස්පේට් සමාගම විසින් මාසිකව නිෂ්පාදනය කරනු ලබන පොහොර ටොන් ප්‍රමාණය;

(ii) කිලෝ ග්‍රෑම් 50ක පොහොර මිටියක් නිෂ්පාදනය කිරීම සඳහා වැය වන මුදල;

(iii) පොහොර නිෂ්පාදනයට දායක වන සේවකයන් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ආයතනය පාඩු ලබන ආයතනයක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ආයතනය, ලාභ ලබන ආයතනයක් බවට පත්කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1458/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට වාර්ෂිකව ආනයනය කරනු ලබන ටින්මාළු ප්‍රමාණය ටොන්වලින් කොපමණද;

(ii) ඒ සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මිරිදිය මාළු, ටින් කිරීම සඳහා පෞද්ගලික ව්‍යවසායකයන් ඉදිරිපත් වී තිබේද;

(ii) එසේ නම්, මිරිදිය මාළු, ටින් කිරීමේ කර්මාන්තශාලා ආරම්භ කිරීම සඳහා තෝරා ගෙන ඇති ජලාශ කවරේද;

(iii) එම කර්මාන්තශාලා ආරම්භ කිරීම සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1504/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වේවැල්, බට සහ තල්කොල ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත දිරිගැන්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම භාණ්ඩ අලෙවි කිරීම සඳහා වෙළෙඳපොළක් තිබේද;

(iii) එම භාණ්ඩ අපනයනය කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) ඉහත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟයකින් තොරව සපයා ගැනීමට වැඩපිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?